# භික්ෂූන් වහන්සේට මුදල් කැපද?

පූජ්‍ය පණ්ඩිත
වරකාගොඩ සීලරතන ස්වාමීපාදයන්
වහන්සේ විසිනි.

ධර්ම දානය පිණිසයි

කොළඹ
ශාසන සංරක්ෂක බෞද්ධ මණ්ඩලයෙන්
ප්‍රකාශිතයි.

# නිවේදනයකි මේ

මෙකල භික්ෂූන්වහන්සේ අතර දියුණුවේගන යන මිළ-මුදල් පරිහරනය ශාසනයට හිතවත් සංඝරත්නයේ වටිනාකම දන්නා සැදැහැවත් බෞඩයන්ගේ මහත් චිත්ත සන්තාපයට හේතුවී තිබේ. ආගම ධර්මය ගැන වැඩි දැනීමක් නැති භික්ෂූන් වහන්සේලා කියන කොයි දේ ගැනත් සැලකිල්ලක් දක්වන ආධුනක ජනතාව කෙරෙහි අනුකම්පාවෙන් මේ ප්‍රශ්නය ගැන පොත් පිංචක් ලියවා ලක්ෂ ගණනින් රටේ ප්‍රසිඩකර හරින්නට යයි බුදුසසුන පාඨක භවතුන්ගෙන් අපට ලැබී තිබෙන ඉල්ලීම කල්පනාවට ගෙන මේ පොත් පිංච ප්‍රසිඩ කරන ලදි. මේ පොත මුද්‍රනය කරවා නොමිලයේ බෙදා හරින්නට කැමති තවත් සැදැහැවත්තු වෙත් නම් අපට දැන්වූ විට ඊට අවකාශ ලබා ගත හැක.

මීට

ශාසන සංරක්ෂක බෞඩ මණ්ඩලය

16 ඩික්මන් පටුමග,
කොළඹ 5.
2508 පොසොන් පුර හෝ දින,
24.6.64
2 වන මුද්‍රණය 26-05-2000

# ප්‍රාර්ථනය

වැඩිගන යන සසුන (විශේෂයෙන් ප්‍රතිපත්ති ශාසනය) නගා සිටුවීමේ ක්‍රියාත්මක වැඩ පිළිවෙලක් වශයෙන් අතිපූජනීය රාජකීය පණ්ඩිත කඩවැද්දූවේ ශ්‍රී ජින වංශාභිධාන මහෝපාධ්‍යාය මාහිමිපාණන් වහන්සේ විසින් පිහිටුවා වදාළ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවට පනස් වෙනි වස ලැබීම නිමිති කොට ධර්ම දාන වශයෙන් නොමිළයේ බෙදා දීම සඳහා උඩුරුගමුවේ සිරි විමලජෝති ස්වාමීන් වහන්සේගේ උපදෙස් පරිදි පන්නිපිටිය, කොට්ටාව, කුලසෙවන පාරේ නොම්මර 704/2 දරණ නිවසෙහි පදිංචි විජිත පරණමාන සහ කුමුදිනී පරණමාන දෙපල සහ දරු දෙදෙනා විසින් මෙම දෙවන මුද්‍රණය කරවන ලදි.

ශ්‍රී ආර්යවිලාස වංශාලංකාර
සද්ධර්ම වාගීස්වරාචාර්‍ය්‍ය:
පටිපත්තිසෝභන ගණපාමොක්ඛාචාර්‍ය්‍ය
යන ගෞරව නාම ධාරී රාජකීය පණ්ඩිත
කඩුවැද්දූවේ ශ්‍රී ජිනාවංශාභිධාන මහෝපාධ්‍යාය
මාහිමිපාණන් වහන්සේට බුදුබව ලැබේවා.
දීර්ඝායුෂ ලැබේවා.

ශ්‍රී ... ධර්මායතනයේ
මකිරිගල.

# භික්ෂූන් වහන්සේට මුදල් කැප ද?

"හාමුදුරුවරුන්ට සල්ලි හොඳ නැ කියන්නේ කවුදැයි මහාචාර්ය පඤ්ඤාකිත්ති හිමියෝ අසති" යන මේ වැකිය 1964 ජනවාරි 31 දින පළවූ "ජනතා" පත්‍රයෙහි ලොකු අකුරෙන් වැටී තිබේ. මේ ස්ථවිරයන් වහන්සේ වනාහි විද්‍යාලංකාර පිරිවෙණෙහි කලකට පෙර සම්භාවනීය මහ තෙරනමක් ලෙස පිළිගැණීමක් තිබුන පණ්ඩිත භික්ෂුනමක් බව රට දන්නා බැවින් මෙබඳු උගතෙක් විසින් කරන ලද කථාවක් නිරුත්තරව යටපත්-වන්නට හැරීම සසුන් විපතකි. එබැයින් මේ කථාව බුඩ වචනය හා ගැලපෙන්නක් දැයි විමසා බැලීම බෞඩයින්ගේ යුතුකම ය.

භික්ෂු ජීවිතයෙහි දහැමි දිවිපෙවත චතුපාරිසුඩ ශීලයෙහි දෙවෙනි ශීලස්කන්ධයෙහි විස්තර වෙයි. යම් භික්ෂුවකට එහි විස්තර වන ලෙස පිරිසිදුව ශීලය නො රැකිය හැකි නම් අධාර්මික ජීවිකාව පැවැත්වීමට වඩා ගෙරිකපන කැත්තෙන් බඩ පලා දැමීම හොඳයයි බුදුරජුන් වදළේය. අකැප මුදලින් තෙල් යොද දල්වූ පහණින් එළිය බැලීම, අකැප මුදලින් දැමූ ඒදණ්ඩ උඩින් යාම ඒම, අකැප මුදලින් ගෙන වැළඳූ අඹ ගෙඩියේ ඇටයෙන් හටගත් අඹගහේ සෙවන ලැබීම වැනි දේ පවා සිල්වත් භික්ෂුන් වහන්සේට අකැප බව විනය නියමය වේ.

වාග්විඥප්තිය නිසා ලැබුන කිරිබත් ආහාරය බඩරුදවේදීත් අකැපය යි ඉවත දමන්නට සැරියුත් හිමියෝ මුගලන් හිමියන්ට නියම කළ සැටි බණ දහම් උගත් ගිහියෝ ද දනිති. භික්ෂු ජීවිතය කොතරම් දුරට පවිත්‍ර විය යුතු ද, දැහැමි විය යුතු දැයි මෙසේ නොයෙක් ආකාරයෙන් හෙළිදරව් කර තිබියදී අද ඉන්නා භික්ෂුන්ට මුදල් නැතුව මහණ කම කරන්ට බැරිය කීමේ හේතුව කුමක් දැයි බෞඩ මහජනයා විමසා බැලිය යුතුයි.

භික්ෂුන්වහන්සේ නමකගේ වුවමනාවක් වුවිට දන්වන්නට යයි කැප වී පැවරී ඉන්නා දයකයෙකුට ඒ වුවමනාව දැන්වූ කල එය සපයා ගැනීමට දෙන ලද මුදලක් වේ නම් එය කැප මුදලකි. තවත් කැපකරුවෙක් ලවා ඒ මුදලින් වුවමනාව ඉටුකර ගැනීමත් එය ඉටු නොවී නම් ඒ බව මුදල දුන් දයකයාට දැන්වීමත් භික්ෂුන්ට ඇති බුඩනියමය වේ. ඒ මුදල පෙට්ටි ලාච්චුවල ද තබාගෙන තමාට මනාප ලෙස වියදම් කිරීම අකැප මුදල් පරිහරනයයි. බණක් කියා–පොතපත උගන්වා ඊට තෑග්ගක් වශයෙන් යමක් ලැබීම ද අලගද්දපයඹීපජ්තියට අයිති වේ. නයා වලිගයෙන් ඇල්ලූ කල සිදුවෙන විපතට සමාන විපතක් එයින් ද සිදුවේ. ධර්ම පූජා වශයෙන් ලබන දෙයක් වේ නම් එය ද ප්‍රත්‍යවෙක්ෂාවෙන්

පිළිනොගෙන අද බොහෝ භික්ෂූන් කරන සිරිතට ඒ පිරිකර විකුණා මුදල් කරවා ගෙන ඒ මුදල් රැස් කිරීමට විනය ධර්මයෙහි අවකාශයක් නැත. භික්ෂූන්ට අකැප වශයෙන් ලැබුන මුදලක් වේ නම් එය බැහැර කොට ඇවැත් දෙසා පුඩවිය යුතු බව බුඩනියමය වේ. ඊට නිස්සග්ගිපාචිත්තියයි කියති. ඒ මුදල් ඇතිතාක් ඔහු අලජ්ජි බවට ද දුශ්ශීල බවට ද පැමිණේ.

මිළ මුදල් සැපයීම සහ පරිහරනය මේ කාලයේ නොකොට නොහැකි දෙයකැයි ද මිළ මුදල් නැතිව මේ කල මහණකම් නොකළ හැකියයි ද බොහෝ භික්ෂූන් කරන ප්‍රකාශයන් ආගම නොදත් බෞඩයන් විසින් ද නිවරද යයි පිළිගන්නා තරමට අද කරුණු සැලසී තිබේ. මහණකම නොකළ හැක්කේ මිළ මුදල් නැතුව නොව මුදල් ඇතුව ය. ජාත රූප රජත ශික්ෂා පදය පමන තද කොට පණවා වදළ අනික් ශික්ෂා පදයක් ඇද්දැයි පඤ්ඤාකිත්ති හිමියන්ගෙන් ඇසිය යුතුය. ශික්ෂා පද සියල්ලම පණවන ලද්දේ කය වචන දෙක පිළිබඳවය. එහෙත් ජාත රූප රජත ශික්ෂා පදය කයින් පිළිගැනීම, වචනයෙන් පිළිගැනීම, සිතින් ඉවසීම යයි කය වචන සිත යන තිදෙරම ගැන පනවා වදළ ශික්ෂා පදයකි-ඇවැත්වන්නේ එලවා තබන ලද රන් රිදි මසු කහවනු කයින් හෝ වචනයෙන් ප්‍රතික්ෂේප නො කිරීම නිසා විනයක්‍රමයෙන් කාය–වාක් දෙදොරෙහි අකිරිය සමුට්ඨානයෙන් වුවද සුත්‍රාන්ත ක්‍රමයෙන් ගත් කල මනො ද්වාරයෙන් ද සිදුවන වරදකි. කායෙන

පටිග්ගහනං, උග්ගහනං, වාචාය පටිග්ගාහාපනං උග්ගාහාපනං මනසා පටිග්ගහනං සාදියනං'ය ටීකායෙහි කියන ලද්දේ එහෙයිනි.

බුදුරජාණන් වහන්සේ විසින් මෙය මෙතරම් දැඩි කොට පණවන ලද්දේ මිළ මුදල් සැපයීම, පිළිගැනීම, දැරීම පමණක් නොව සිතින් ඉවසීම වත් කරන්නෙකුට මහණකම හරිහැටි නො කළ හැකි හෙයිනි. ශාසනික මහණකම නොව බාහිර පැවිද්ද පවා මිළ මුදල් පරිහරණයෙන් තොරය. මිළ මුදල් පරිහරනය කරන්නෙක් ප්‍රව්‍රජ්‍යා සංඛ්‍යාවෙහි ඇතුළත් නොවේ. ගිහි දශශිල සාමණේර දශශිලයන්ටද මේ ශික්ෂා පදය අයත්'ය. සාමණේරනමක් මුදල් පිළිගතහොත් පරිහරනය පටන්ගතහොත් ඒ නමගේ අනික් ශික්ෂා පද ද බිඳී යති. උභතොශුඩියෙන් ලබන ලද උසස් ශිලයක් වූ බැවිනි. මුදල් පරිහරනය සළකරුණක් නම් තුන්කල් දත් බුදුරජුන් විසින් "ජාත රූප රජත පටිග්ගහනා වෙරමණී" යන ශික්ෂාපදයක් කුමට ඇතුලත් කරන ලද්දේ දැයි සාමාන්‍ය මොලයකට වුවත් වැටහි යා යුතුය. මිළ මුදල් පරිහරනය කරන ශ්‍රමණතෙම ශාසනික භික්ෂුවක් තබා තාපසයෙකුවත් නොවන බව බෞඩයින් දැනගත යුතුය. බාහිර තවුසන් පවා මිළ මුදල් පරිහරනයෙන් වෙන් විය යුතුය.

සාමඤ්ඤඵල, ධම්මදයාද, ආකඞ්ඛෙය්‍ය, චූලහත්ථි පදෙපමාදි සූත්‍ර දේශනාවන්හි සඳහන් මහණ පිළිවෙතත් අද බොහෝ මහණුන්ගේ පැවැත්මත් හාත්පසින් වෙනස් ය. මෙය ප්‍රගතියයි ද කාලයට ඔබිනසේ පිළියෙල විය යුතු යයි ද සමහරු කියති. ශාසනයෙහි එකම ගතියක් මිස ප්‍රගතියක් නැත. ශාසනයට ඔබින සේ මිස කාලයට ඔබින සේ කළ යුතු මහණ කමක් බුඩ දේශනාවේ නැත. නිවන් යන මාර්ගය එකක්ම මිස දෙකක් නැත. එකම ප්‍රතිපත්තියක් මිස ප්‍රතිපදා දෙකක් නැත. එකම ආර්‍ය මාර්ගයක් මිස ආර්‍ය මාර්ග දෙකක් නැත. එකම නිවනක් මිස දෙනිවනක් නැත. ඒ හෙයින් මහණකම තබා බෞඩකමක්වත් කාලයට හරියනසේ වෙනස් නොකළ හැකි බව ශාසනොදයකාමී පින්වත් බෞඩයින් විසින් තරයේ සිතාගත යුතුය.

කලකට පෙර පාණදුරේ වළපොල ශ්‍රී සඞමෝදය පිරිවෙනාධිපති අති ගරු කොදගොඩ උපසෙනාභිධාන අධිකරණ නායක සථවිර පාදයන් වහන්සේ විසින් පළකරන ලද මතු සඳහන් ධර්මවිනිශ්චය මේ ප්‍රශ්නය පිළිබඳව හැමදෙනා විසින් ම සිත් වලට ගත යුතුය. ඒ මෙසේයඃ– "ගොර බිරම් සසර දුක් ගෙවා නිවන් සුව අත්පත් කර ගන්නා අටියෙන් ගිහිකම් රස හැර බුදු සසුන් වැද මහණ දම් රක්නා ථෙරමජ්ඣිම නවක සාමණෙර යන සකල පැවිදි තැන්ගේ මහණුවම් යෙහෙන් මුදුන් පත් කර ගැනීම නිවන් සුව අත්පත් කර ගැනීමට මුල් හේතුවයි. මහණකමේ මුල් කොටස සීල සම්පත්ති යයි.

මැද කොටස සමාධි සම්පත්ති යයි. අග කොටස ප්‍රඥා සම්පත්ති යයි. එයින් සීල සම්පත්තිය නො ලබා සමාධි සම්පත්ති ප්‍රඥා සම්පත්තීන් කිසිසේත් ලැබිය හැකි නොවේ. එ හෙයින් ප්‍රාතිමොක්ෂ සංවර ශිල – ඉනද්‍රිය සංවර ශීල - ආජීව පාරිශුඩි ශීල - ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීල යන චතු පාරිශුඩි ශිලය සිය දිවි මෙන් ද, එකැසක් ඇත්තෙකු ඒ ඇස රක්නාක් මෙන් ද - එක් පිය පුතෙකු ඇති මවක් ඒ පුතු රක්නාක් මෙන් ද - ආදරයෙන් රැක්ක යුතුය. එසේ ඒ සතර සංවර ශිලය රකිනු කැමති පැවිද්දන් විසින් ශ්‍රමණොපක්ලෙශයන් කෙරෙන් වෙසෙසින් වෙන් විය යුතුය - ශ්‍රමණොපක්ලෙශයෝ නම්:-

"රාග දෙස පරිකිට්ඨා-එකෙ සමණ බ්‍රාහ්මණා
අවිජ්ජානිවුතා පොසා-පිය රූපාභි නන්දිනො
සූරං පිවන්ති මෙරයං-පතිසෙවන්ති මෙථුනං
රජතං ජාතරූපඤ්ච-සාදියන්ති අවිද්දසූ.

මිච්ජා ජ්වෙන ජීවන්ති-එකෙ සමණ බ්‍රාහ්මණො
එතෙ උපක්කිලෙසා වුත්තා-මූනිනාදිච්ච බන්ධුනා"
(අඞ්ගුත්තර නිකාය)

රාග වෙෂයෙන් විශෙෂයෙන් කිළිටු වූ - අවිද්‍යාවෙන් වැසීගියා වූ - ප්‍රිය සවභාව ඇත්තා වූ රූපාදී ආරම්මණයන් සතුටින් පිළිගන්නා වූ -ගුණහීන, පුරුෂ වූ - නොහොත් ආත්ම පෝෂණය කරන්නා වූ - ඇතැම් මහණ බමුණෝ-

රහමෙර පානය කෙරෙත් ද මෙවුන්දම් සේවනය කෙරෙත් ද - රන් රිදී මසු කහවණු පිළිගනිද් ද - අනෙසන කුල දූසන කුහන ලපනාදී මිථ්‍යා ආජීවයෙන් ජිවත් වෙද්ද - මෙකී චතුර්විධ දුශ්චරිතයෝ ශ්‍රමණ ගුණය කිළිටි කරණ උපක්ලෙශයෝ යයි ආදිච්ච බන්ධු නම් බුදුරජාණන් වහන්සේ විසින් වදරණ ලදහ.

(1) මත්පැන් පානය කිරීම.
(2) මෛථුන සේවනය.
(3) රන් - රිදි - මිළ - මුදල් පිළිගැනීම.
(4) මිථ්‍යා ආජීවයෙන් ජිවත් වීම.

යන මේ කරුණු සතර ශ්‍රමණයන්ගේ ගුණ දූෂ්‍ය කරණ උපක්ලෙෂයන් බව බුදුන් විසින් ම වදළ හෙයින් මේ චතුර්විධ දුශ්චරිතයන් මහා සාවද්‍ය යයි පිළිගත යුතු ම ය. රන් - රිදී - මිළ - මුදල් භාර ගැනම ගනුදෙනු කිරීම ශ්‍රමණයන්ට කැප නම් මත්පැන් පානය කිරීම, මෛථුන සේවනය මිථ්‍යා ජීවය යන දුශ්චරිතත් කැප වෙති.

තවත් මේ ගැන භාග්‍යවතුන් වහන්සේ විසින් මණිචූළ නම් ගම් මුදලියෙකුට වදරණ ලද දේශනා ක්‍රමයක් මෙසේය:-

නහි ගාමණී කප්පති සමණානං සක්‍ය පුත්තියානං ජාත රූප රජතං, නසාදියන්ති සමණා සක්‍ය පුත්තියා ජාතරූප රජතං,

තික්ඛිත්ත මණි සුවණ්ණා සමණා සක්‍ය පුත්තියා අපෙත ජාත රූප රජතා.

එම්බා ගම් මුදලිය:- ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන්ට රන් - රිදි -මිළ - මුදල් කැප නොවන්නේ ය. (එහෙයින් ම) ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ රන් - රිදි - මිළ - මුදල් නො ඉවසත්. පිළිනොගනිත්. ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ බහා තබන ලද හෙවත් ප්‍රතික්ෂෙප කරණ ලද මිණි රුවන් ඇත්තෝ ය. රන් - රිදි - මිළ - මුදල් ගනුදෙනු ආදියෙන් පහ වූවෝය.

"යස්ස බො ගාමණී ජාත රූප රජතං කප්පති-පඤ්චපි තස්ස කාමගුණා කප්පනති."

එම්බා ගම් මුදලිය, යම් ශ්‍රමණයෙකුට රන් - රිදී - මිළ - මුදල් කැප වේ නම් ඔහුට රූප, සද්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ-යන ස්ත්‍රි පඤ්ච කාමයෝ ද කැප වෙත්. 'යස්ස පඤ්ච කාමගුණා කප්තන්ති එකංසෙන ගාමණී ධාරෙය්‍යාසි අස්සමණධම්මො අසක්‍ය පුත්තිය ධම්මොති.' ගම් මුදලිය, යම් මහණෙකුට පස්කම් රස කැප වෙත් නම් එය ඒකාන්තයෙන් ම අශ්‍රමණ සවභාවක අශාක්‍ය පුත්‍ර සවභාවයක් යයි දනගනුව.

"අපි චාහං ගාමණී එවං වදමි. තිණං තිණත්ථිකෙන පරියෙසිතබ්බං: සකටං සකටත්ථිකෙන පරියෙසිතබ්බො නත්වෙවාහං ගාමණී කෙනචි පරියායෙන ජාත රූප රජතං සාදිතබ්බං පරියෙසිතබ්බන්ති වදමි"ත.

ගම් මුදලිය මම නැවත මෙබඳු කරුණක් කියමි. (එනම්):-
යම් ආවාසයක කුටියක වසන කල එය වැස්සෙන් තෙමී යන කල සෙවෙලි කර ගැනීමට තණ පිදුරු පොල් අතු පතුරු උළු ආදිය උවමනා කරණ පැවිදි තැන් විසින් ඒ තෘණ ආදිය සොයා ගත යුතුය. එසේම පරාල යටලී ආදිය පිණිස දැව සොයා ගත යුතුය. ඒවා ගෙන්වා ගැණීමට ගැළක් උවමනා නම් එය සොයා ගත යුතුය. ඒ වැඩ කරවා ගැනීමට පුරුෂයෙක් සොයා ගත යුතුය. ගම් මුදලිය! මම කිසිම ආකාරයකින් නොහොත් කිසිම කාරණයක් හේතු කොට ගෙන මහණුන් විසින් රන් - රිදී - මිල - මුදල ඉවසිය යුතුයයි සෙවිය යුතු යයි නො කියමි." භික්ෂූන් වසන සඟ සතු වූ හෝ ගණ සතු වූ හෝ ආවාස විහාර ජන්තාඝර, සක්මන් මළු, කෙසකිළි-වැසිකිළි ආදිය තෙමීමෙන් කැඩී - බිඳී යන කල ඒවා සෙවෙලි කර ගැනීමට වුවමනා කරණ තණ කොළ පිදුරු ආදිය හා ලී දඬු ද, ඒවා ගෙණ යාමට ගැල් ද, කර්මාන්ත කරවා ගැනීමට පුරුෂයන් ද සොයා ගැනීම නිදෙස් බවත් ඒ ගැන අකැප වූ මිල - මුදල් කිසිම ආකාරයකින් නොහොත් ඒ කිසිවක් හේතුකොට ගෙන නො සෙවිය යුතු බවත් මේ ගාමණි සූත්‍ර දේශනාවෙන් ප්‍රකාශ කළ සේක. මේ ගැන සාරත්ථ දීපනී විනය ටීකාවෙහි:-

"නත්වෙවාහං කෙනචි පරියායෙනාති-ජාත රූප රජතං පනාහං කෙනචිපි කාරණෙන-පරියෙසිතබ්බන්ති න වදමි."

කිසිම කරුණක් හේතු කොට ගෙන රන් - රිදී - මිළ - මුදල් මහණුන් විසින් සෙවිය යුතු යයි මම නොකියමි යි-දත් වූ හෙයින් අසවල් කරුණ හේතු කොට ගෙන මහණුන් විසින් මිළ - මුදල් සෙවිය යුතු යයි මෙකල වසන කිසිම පඬුවෙක් ඒ හේතු පෙන්වීමට සමත් නොවේ.

එසේද වුවත් ගෞතම බුඩ ශාසනයාගේ ඉකුත් වූ වර්‍ෂ 2471 කාලයෙන් මේ කාලයෙහි ලඩ්කා, බුරුම, සියම් ආදී රටවල වසන සියලු පැවිද්දෝ ලක්‍ෂයක් වෙත්නම් ඔවුනතුරෙන් රන් - රිදී - මිළ - මුදල් සෙවීම් පිළිගැනීම් ගණුදෙනු කිරීම් ආදියෙන් තොර වූ පැවිද්දන් දහසක් තෝරා ගැනීම ඉතා අපහසු යයි කීම මුසවා වශයෙන් පිළිගත යුතු නොවේ.

තවද යට දක්වූ චතුර්විධ ශ්‍රමණොපක්ලේශයන් අතුරෙන් රන් - රිදී - මිළ - මුදල් ඉවසීම හා මිථ්‍යාජීවය අනිකුත් උපක්ලේශයන්ට වඩා විසම වූ අනිකුත් සියලුම ශ්‍රමණොපක්ලේශයන්ට තිඳනවූ මහාපරාධ දුශ්චරිත එයකි. මත්පැන් පානයෙන් පැවිද්දන්ට "පචිත" නම් වරදත් වේ. මෛථුනයෙන් පරිජිවේ. රුපියා පටිග්ගහණයෙන් හා මිථ්‍යා ආජිවයෙන් පරිජ් සඟ වෙසෙස් තුලැසි පචිති පාටි දෙසනිය දුකුළා යන ඇවැත් ඒ ඒ ක්‍රියා වශයෙන් වෙති. මෙයින් සිදුවන දෙස් අනන්තයි. අවිද්‍යා-භව තෘෂ්ණා යන දෙක සියලු සසර දුකට හේතු වන්නාක් මෙන් සියලු මහණදම් වැනසී යාමට මිළ-මුදල් පිළිගැනීම හා මිථ්‍යා ආජීවයත් හේතු වෙත.

උපසපන් නමක් පරිපී සහ වෙසෙස් ආදී වරදකට පත්ව පසුව සාමණේරව සගමොක් සුව ලබා ගත හැක්කේ වේ. යම් උපසපන් නමක් මිල - මුදල් සොයා තම සතු කොට තබා සාමණේර වුවත් ඒ මුදල් හිමිකම ඇතිතාක් සග මොක් සුව නො ලබයි. මිළ - මුදල්, කෙත්වත්, ගම් බිම් ආදිය සපයා තම සතු කොට තබා මරණාසණ්න කාලයෙහි සාමණේරව මැරෙන පැවිද්දන්ට ද සුව ලැබෙන හැටියක් බුඩාගමෙන සොයාගත නොහැකිමය. තමන් සපයා ගත් මිල -මුදල් වියදම් කොට සාදවා ගත් ආවාසයක මිය යන්නාවූ ද, එසේම මිළ - මුදල් දී ගන්නා ලද පාසිවුරු ආදී කොයිම පිරිකරක් වත් පාවිච්චි කරණ කල හෝ යටත් පිරිසයින් මිළ -මුදල් වියදම් කොට බෙහෙත් කරවා ගන්නා කලැ හෝ මිය යන්නාවූ ද පැවිද්දන්ටත් සුවයක් නොලැබේ.

මවු-පිය සහෝදරාදීන්ගේන් වත් මිල-මුදල් ඉල්වා ගැනීම වරදම ය. සඟසතු, ගණසතු, තම සතු කොස්, පොල්, අල, බතල,වී, හාල්, රෙදි-පිළි, පා සිවුරු, පොත්-පත් ආදි මොනම දෙයක්වත් විකිණීමෙන් හෝ වෙදකම්, නැකැත් යොද දීමෙන් හෝ ශිල්ප-ශාස්ත්‍රයාදිය උගැන්වීමෙන් හෝ බණ කීමෙන් හෝ මිල-මුදල් සපයා ගැනීම පැවිද්දන් විසින් නොකොට යුතුවු ම දුශ්චරිතයකි. මෙකල බොහෝ පැවිද්දෝ සිය මවු පියන් සතු වස්තුවෙන් දයාද කොටස් ලබාගනිති. හේ ද බලවත් වරදකි. සිය සතු සියලු වස්තූන් හැර සසුන් ගතවූන්ට මවු-පියන්ගේ දයාදයක් කිනම් නීතියකින් අයිති වේද?

මේ අපරාධ ක්‍රියාවෙනුත් මහණ ධර්ම වනසා ගන්නෝ බොහෝය.

මෙකල බුදු සමය අදහන බොහෝ පැවිද්දෝ එක්ව තෙරුවන් නෘත්‍යාවයවයක් මෙන් ඉදිරියට පා නොයෙකුත් උපායෙන් මිල-මුදල් සපයා ඉණ බඩ වඩා ගැනීමට ප්‍රයත්න කෙරෙති.දාගැබක්, පිළිම ගෙයක්, බෝගෙයක්, පොත් ගෙයක්, තනා ගත් අය එහි සම්මාදම් පෙට්ටියක් තබති. කාසි පෙට්ටි නොරක්නා බුදු පිළිමයක් මෙලකැ සොයාගැනීම අපහසු ය. මල් වට්ටි, බුලත් වට්ටි, තවත් නොයෙකුත් රැඩා රොඩු වෙන්දේසි නොකරණ බණ පලක් සොයා ගැනීම ද අපහසුය.අහෝ පිරිසිදු බුදු සසුන තින්දිත ලාමක අගෞරව සංඛාත නරකාවාට යෙහි හෙළති. සැඩොලුන් අතට පත් සක්විති රජුන්ගේ මහඟු ඔටුන්න බලුමස් පුරවාලීමට භාජනයක් කර ගන්නාක් මෙන් බුඩාදී උත්තමයන් විසින් සසර දුකින් එතර වීම පිණිස සම්පාදනය කොට පස්වාදහසක් පවත්නාසේ ස්ථිරව තබන ලද්දවූ අති පරිශුඩ ශ්‍රෙෂ්ඨතර ශාසන ධර්මය අසූචියෙහි වැටී දහලන අනුවණයන් විසින් ලාමක ස්ථානයෙහි දමා වෙසෙසින් කිළිටි කිරීම අහෝ මහාපරාධයකි.

මෙකල ශ්‍රමණයන් අතර පවත්නා ඒ මේ බලවත් අනාචාර දුශ්චරිත විපත්තියෙහි ආදීනව කල්පනා කරන අප තුළැ උපදනා බලවත් සංවේගය දරාගත නොහැකි බැවින් අප විසින් ප්‍රකාශ කරණු ලබන කරුණු ගැන බොහෝ ගිහි පැවිදි පින්වත්හු

අප කෙරෙහි නො ඉවසීමට පත්වෙත්යයි හැඟීමට ද අවකාශ ඇත්තේ ය. එසේ ද වුවත් මේ අපගේ කීමෙහි සත්‍යාසත්‍යතාව ප්‍රත්‍යක්ෂ වශයෙන් විමසත්වා!

මෙලක්දිවැ තුන්නිකායේම දැන් වසන සථවිර මධ්‍යම නවක සාමණේර යන සියලුම පින්වත්හු සම්‍යක්දෘෂ්ටියෙහි පිහිටා ප්‍රඥප්ති ව්‍යති ක්‍රමනයෙහි ආදිනව මනා සිහි නුවණින් සලකා බලා දුකසේ ලත් සසුන් පැවිදිකමින් ලැබිය යුතු පිහිට ලබාගැනීමට ශ්‍රද්ධා වීර්‍ය්‍ය හිරි ඔතප්, සමෘති, ප්‍රඥදි, කුසල ධර්‍මයන් තම තමන් කෙරෙහි උපදවා ගැනීමෙන් වෙසෙසින්ම රන්-රිදී-මුදල් සොයා ලබා ගනුදෙනු කිරීම් ආදියෙන් තොරවැ ශීලශුද්ධියෙහි පිහිටා සසර දුකින් එතරව නිවන් පුර වදනට සනතයෙන් උත්සාහ කෙරෙත්වා.

"න ඛ්වා' හං භික්ඛවෙ කෙනචි පරියායෙන ජාත රූප රජතං සාදිතබ්බං පරියෙසිතබ්බංති වදමි" යන බුද්ධ වචනය විනය පොතෙන් අස්කරනතුරු අරවිදියෙන් මේ විදියෙන් මුදල් පරිහරනය කරන්ට ඉඩ තිබේය යන අලජ්ජි පාක්ෂිකයින්ගේ කථාව බෞද්ධ ජනයා විසින් භාර නොගත යුතු ය. "මහණෙනි, කිසිම ආකාරයකින රන්-රිදී, මසු-කහවණු ආදිය සොයන්නට වත් පිළිගන්නටවත් මම තොපට නොකියමි' යනු මේ වැකියේ අදහස ය-බුද්ධ වචනය මෙ තරම් පිරිසිදු ලෙස-පෙන්නුම් කර දී තිබියදී අර තෙරුන් කීවාය, මේ තෙරුන් කීවාය, අර තෙරුන් මේ තෙරුන් අරදේ කොට, මේ දේ කොට

මුදල් පිළිගත්තාය කීමෙන් වත්-අර රජුන් මේ රජුන් සිලා ලිපිවල යම් යම් දේ ලියවා තිබේ යයි කීමෙන් වත් බුඩ වචනයට විරුඩව යම් පැවිද්දෙක් භික්ෂූන්ට මුදල් පරිහරනය නිවැරදිය කියන්නේ නම් ඒ ජින චක්‍රයට පහර දීමක් බව ශාසනමාමක බෞඩයින් විසින් සැක හැර දත යුතුය.

---

මීතිරිගල.